## අධ්‍යාපන අමාත්‍යාංශය - කෘෂිකර්ම හා පරිසර අධ්‍යයන ශාඛාව

**'සිසු නැණ පවුර' සම්මන්ත්‍රණ මාලාව**

**අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2024 සඳහා පෙරහුරු ප්‍රශ්න පත්‍රය**

| කෘෂි විද්‍යාව II | 08 | S | II |
|---|---|---|---|

## B කොටස - රචනා

උපදෙස් :

- ❖ ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.
- ❖ අවශ්‍ය තැන්හි දී නම් කරන ලද පැහැදිලි රූප සටහන් දෙන්න.

5. (i) 'ආරක්ෂිත ව්‍යුහ' තුළ බෝග වගා කිරීමේ දී ඇති වන ගැටලු විස්තර කර එම ගැටලු අවම කිරීමට උචිත ක්‍රමෝපායන් සඳහන් කරන්න.
   (ii) ශාක ප්‍රචාරණයේ දී යොදා ගන්නා බද්ධ කිරීමේ ප්‍රධාන ආකාර දෙක සඳහන් කර ඒවා යටතේ බද්ධ ක්‍රමය බැගින් නම් කළ රූපසටහන් සහිතව විස්තර කරන්න.
   (iii) බිම් සැකසීම මගින් පසේ භෞතික ගුණාංග බෝග වගාවට උචිත ආකාරයට සකස් කර ගන්නා ආකාරය පැහැදිලි කරන්න.

6. (i) කෘෂි කාලගුණික මධ්‍යස්ථානයකින් ලබා ගන්නා කාලගුණ දත්ත කෘෂිකාර්මික කටයුතුවල දී භාවිතවන අවස්ථා විස්තර කරන්න.
   (ii) බෝග වගාවේ දී බාහිර පරිසරය කළමනාකරණය කරමින් රෝග පාලනය කරන ආකාරය විස්තර කරන්න.
   (iii) ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය පිළිබඳ සැළකීමේ දී ශාක අභිජනනයේ අරමුණු විස්තර කරන්න.

7. (i) 'පාංශු සෞඛ්‍යය' පිරිහීමට හේතුවන සාධක/ ක්‍රියාකාරකම් සඳහන් කර පාංශු සෞඛ්‍යය දියුණු කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග විස්තර කරන්න.
   (ii) බෝග වගා ක්ෂේත්‍රවල ජලවහනය කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න.
   (iii) කුකුළු ගොවිපොළකට ගෙනෙන ලද දිනක් වයසැති බ්‍රොයිලර් කුකුළු පැටවුන් මස් පිණිස අලෙවිය තෙක් පාලනය කරනු ලබන ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

8. (i) පාරිභෝගිකයින්ගේ දියර කිරි ඉල්ලුම කෙරෙහි බලපාන සාධක විස්තර කරන්න.
   (ii) විවිධ අවස්ථාවලට 'පසු අස්වනු හානි' සිදුවන අවස්ථා හා එම අවස්ථාවල දී පසු අස්වනු හානි අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග විස්තර කරන්න.
   (iii) උසස් ගුණාත්මක අගයෙන් යුතු සයිලේජ් නිපදවීමේ දී අනුගමනය කළ යුතු පියවර සහ එහි දී සැලකිය යුතු කරුණු විස්තර කරන්න.

9. (i) කෘෂිකර්මාන්තයේ දී ජෛව පොහොර භාවිතයේ වැදගත්කම විස්තර කරන්න.
   (ii) සංරක්ෂණ ගොවිතැනේ දී පෝෂක සංරක්ෂණය සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග විස්තර කරන්න.
   (iii) බෝගවල ඵල හට ගැනීමට හේතුවන පරාගනයට දායක වන ජීවී පරාග කාරක හිඟ වීමට බලපාන හේතු කෙටියෙන් විස්තර කරන්න.

10. (i) බෝග ශාකවල ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීමට යොදා ගත හැකි උපායමාර්ග විස්තර කරන්න.
    (ii) ආහාර නරක් වීමට බලපාන භෞතික සාධක විස්තර කරන්න.
    (iii) පහත වගුව සම්පූර්ණ කර ප්‍රශ්න (a) සහ (b) හි සඳහන් පිරිවැය වක්‍ර ප්‍රස්ථාර කඩදාසියක වෙන වෙනම ඇඳ දක්වන්න.

    (a) නිෂ්පාදන ඒකකවලට අනුරූපව මුළු ස්ථාවර පිරිවැය, මුළු විචල්‍ය පිරිවැය සහ මුළු පිරිවැය
    (b) නිෂ්පාදන ඒකකවලට අනුරූපව සාමාන්‍ය විචල්‍ය පිරිවැය, සාමාන්‍ය ස්ථාවර පිරිවැය, සාමාන්‍ය මුළු පිරිවැය සහ ආන්තික පිරිවැය

| නිෂ්පාදන ඒකක | මුළු ස්ථාවර පිරිවැය | මුළු විචල්‍ය පිරිවැය | සාමාන්‍ය ස්ථාවර පිරිවැය | සාමාන්‍ය විචල්‍ය පිරිවැය | මුළු පිරිවැය | සාමාන්‍ය මුළු පිරිවැය | ආන්තික පිරිවැය |
|---|---|---|---|---|---|---|---|
| 0 | 100 | 0 | | | | | |
| 1 | 100 | 50 | | | | | |
| 2 | 100 | 90 | | | | | |
| 3 | 100 | 120 | | | | | |
| 4 | 100 | 140 | | | | | |
| 5 | 100 | 150 | | | | | |
| 6 | 100 | 156 | | | | | |
| 7 | 100 | 175 | | | | | |
| 8 | 100 | 208 | | | | | |
| 9 | 100 | 262 | | | | | |
| 10 | 100 | 305 | | | | | |